www.agaram.lk

NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 11 ශ්‍රේණිය | පෙරදිග සංගීතය | 1 ඒකකය |
|---|---|---|

### ආදර්ශ ප්‍රශ්න පත්‍ර

01. ආරෝහණයේ හා අවරෝහණයේ යෙදෙන ස්වර සංඛ්‍යාව අනුව තීරණය වනුයේ,

(i). වාදි ස්වරයයි (ii). රාග ජාතියයි (iii). ගායන සමයයි (iv). මේලයයි

02. භාරතීය රාගධාරි සංගීත පද්ධතීන්ට අදාළ වන ප්‍රධාන සංගීත ක්‍රම දෙක හඳුන්වන්න.

(i). හින්දුස්ථානි-කර්ණාටක (ii). ගසල්-භජන් (iii). කර්ණාටක-භජන් (iv). හින්දුස්ථානි-වංග

03. රි ගු රි ම ගු රි ම - යන ස්වර සංගතිය යෙදෙන රාගය වනුයේ,

(i). බිලාවල් ය (ii). භූපාලි ය (iii). කාපි ය (iv). යමන් ය

04. කල්‍යාන මේලයෙන් උපදින රාග දෙකක් වනුයේ,

(i). භූපාලි, යමන් (ii). බිලාවල්, යමන් (iii). කාපි, බිලාවල් (iv). භූපාලි, භෛරවි

05. භූපාලි රාගයේ,

(i). රි, ම වර්ජිතය (ii). ම, නි වර්ජිතය (iii). රි, ප වර්ජිතය (iv). ග, ධ වර්ජිතය

06. රි ග ම් ධ නි යන ස්වර 5 විවාදි ස්වර වශයෙන් යොදා ගන්නා රාගයකි.

(i). යමන් (ii). කාපි (iii). භූපාලි (iv). භෛරවි

07. ස්වර 7 ම ශුද්ධව යෙදෙන රාගයකි,

(i). කාපි රාගය (ii). බිලාවල් රාගය (iii). යමන් රාගය (iv). භෛරවි රාගය

08. යමන් රාගයේ විශේෂ ලක්ෂණයක් වන්නේ,

(i). තීව්‍ර මධ්‍යමය යොදා ගැනීම (ii). සියළු ස්වර ශුද්ධ වීමය (iii). කෝමල ධෛවතය යොදා ගැනීම (iv). ගාන්ධාරය කෝමල වීමය

09. රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයෙන රාග යුගලයකි,

(i). යමන්, කාපි (ii). භූපාලි, යමන් (iii). බිලාවල්, භූපාලි (iv). කාපි, භෛරවි

10. ඔබ උගත් රාග අතරින් සම්පූර්ණ ජාති රාගයක් නොවන්නේ,

(i). භෛරවි රාගය (ii). භූපාලි රාගය (iii). බිලාවල් රාගය (iv). කාපි රාගය

11. ඖඩව ජාති රාගයක් යනු,

(i). ස්වර 6ක් යෙදෙන රාගයකි (ii). ස්වර 5ක් යෙදෙන රාගයකි (iii). ස්වර 7ක් යෙදෙන රාගයකි (iv). ස්වර 4ක් යෙදෙන රාගයකි

12. කෝමල නිෂාදය හා කෝමල ගාන්ධාරය යෙදෙන රාගයක් වනුයේ,

(i). බිලාවල් රාගය (ii). කාපි රාගය (iii). භෛරවි රාගය (iv). යමන් රාගය

13. ස ධ ප ධ | ම ප ම ගු | ම - - - | ස රි ගු ම | මෙම ස්වර පාදය අයත් රාගය වනුයේ,

(i). කාපි රාගය (ii). බිලාවල් රාගය (iii). භූපාලි රාගය (iv). භෛරවි රාගය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk

14. ගායන සමය රාත්‍රී II ප්‍රහරයේ ගැයෙන රාගයකි,

(i). භූපාලි (ii). කාපි (iii). යමන් (iv). බිලාවල්

15. සරිප යන ස්වර ඛණ්ඩය අනුවාදි ලෙස යෙදෙන රාගය වනුයේ,

(i). භූපාලි රාගය (ii). යමන් රාගය (iii). කාපි රාගය (iv). බිලාවල් රාගය

- **පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

16. බිලාවල් රාගයේ අනුවාදි ස්වර ලියන්න.
17. ග ප ම ග ම රි ස, ග ප ධ නි ස්, ලෙස ස්වර සංගති යෙදෙන රාගය නම් කරන්න.
18. රාගයක වාදි, සංවාදි ස්වර හැරුණු විට සෙසු ස්වර කුමන නමකින් හඳුන්වයිද?
19. නිෂාදය දෙයාකාරයකින් යොදා ගන්නා රාගය නම් කරන්න.
20. එක් විකෘති ස්වරයක් යෙදෙන රාගය නම් කර එම රාගයේ වාදි සංවාදි ස්වර ලියන්න.
21. ස්වර 12 ම යෙදෙන රාගය නම් කරන්න.
22. විවාදි ස්වර යනු මොනවාද? රාගයක් ඇසුරින් පැහැදිලි කරන්න.
23. ඔබ උගත් ඖඩව ජාති රාගයක ආරෝහණ අවරෝහණ ලියන්න.
24. රාගාශ්‍රිත සරල ගී යනු මොනවාද? උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.
25. දෙවන සමයේ රෑ පූරණ ජාතිව මෙම ස්වර පාදය අයත් රාගය නම් කරන්න.
26. සියළුම ස්වර ශුද්ධව යෙදෙන ඖඩව ජාති රාගය නම් කරන්න.
27. වර්ජිත ස්වර යනු මොනවාද? ඔබ උගත් වර්ජිත ස්වර ඇතුළත් රාගය නම් කරන්න.
28. යමන් රාගයට අදාළ ස්වර සංගතියක් ලියන්න.
29. වාදි, සංවාදි ස්වර යන්න කෙටියෙන් හඳුන්වන්න.
30. යමන් හා භෛරවි රාගවල මුඛ්‍යාංගයන් ලියන්න.
31. පහත සඳහන් රාගධාරි වගුව පුරවන්න.

| රාගය | ථාටය | ආරෝහණ අවරෝහණ | ජාතිය | වාදි-සංවාදි | මුඛ්‍යාංග | ගායන සමය |
|---|---|---|---|---|---|---|
| බිලාවල් | | | සම්පූර්ණ | | | |
| කාපි | | | - | | | |
| භූපාලි | | | ඖඩව | | | |
| යමන් | | | - | | | |
| භෛරවි | | | සම්පූර්ණ | | | |

32. රාගයක් අලංකාර කර ගැනීමට විවිධාකාර තානාලංකාර වර්ග යොදා ගනී. පහත සඳහන් තානාලංකාර වර්ග පිළිබඳ කෙටි හැඳින්වීමක් කර එක් එක් තානාලංකාරයට උදාහරණය බැගින් ලියන්න.

(i). ආකාර්තානි (iii). මිශ්‍ර තාන් (v). අලංකාරික තාන්

(ii). සපට්තාන් (iv). ස්වරාක්ෂර තාන්

33. පහත සඳහන් ස්වර ඛණ්ඩ 3 කාපි, භෛරවි, යමන් රාගාංග ඇතුළත්ව ප්‍රබන්ධ කර ඇත. එම ස්වර ඛණ්ඩවලට අදාළව නිවැරදි කර නැවත ලියන්න.

(i). නි̣ රි ග ම ග රි ස, ප ම ග ම ග රි ස

(ii). ධ̣ නි̣ ස රි ස, ස රි ග ම ග රි ස රි ස

(iii). රි ග රි ම ග රි ස රි ප ම ප රි නි ධ නි ප ධ ම ප

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

➢ 34 සහ 35 ප්‍රශ්න 33 වන ප්‍රශ්නය හා සම්බන්ධ වේ.

34. අංක (ii) අදාළ රාගයට අදාළ වාදි, සංවාදි, අනුවාදි ස්වර ලියන්න.

35. එම රාගයේ මධ්‍යලය ගීතයේ අන්තරා කොටසෙහි ගීතය හා ස්වර ප්‍රස්ථාරය ලියන්න.

36. පහත සඳහන් තොරතුරු ඉදිරියෙන් අදාළ රාගය නම් කරන්න.

- ❖ කල්‍යාන ථාඨයෙන් බිහිවී ඇත
- ❖ සර්ව කෝමල රාගයකි
- ❖ රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගායනා කෙරේ
- ❖ නිෂාද දෙකම යොදා ගැනේ
- ❖ එක් විකෘති ස්වරයක් යෙදේ
- ❖ ශුද්ධ ස්වර 7 ම යොදා ගැනේ
- ❖ ප̣ ධ̣ ස රි ග, ග රි ස ධ̣ රි ස
- ❖ දිවා ප්‍රථම ප්‍රහරයේ ගායනා කෙරේ
- ❖ ම, ස, ස්වර වාදි සංවාදි වේ
- ❖ ග රි ග ප ධ නි ස්  ලෙස ස්වර සංගති යෙදේ
- ❖ රි ග̲ රි ම ග̲ රි ස  සංගතිය යොදා ගැනේ
- ❖ ධ, ග  වාදි සංවාදි වේ
- ❖ ප, ස්  වාදි සංවාදි වේ
- ❖ නි ධ - ප ම් ප ග ම්  ලෙස ස්වර යොදා ගැනේ
- ❖ ඉහත රාග අතරින් එක් තීව්‍ර ස්වරයක් යෙදෙන රාගයේ ලක්ෂණ ගීතය (ස්වර හා ගීතය) ලියා එම රාගයට අදාළ තානාලංකාර දෙකක් නිර්මාණය කර ලියන්න.

37. (i). කාපි රාගය හා භූපාලි රාගය අතර ඇති වෙනස්කම් මොනවාද?

(ii). ඉන් භූපාලි රාගයට අදාළ මධ්‍යලය ගීතය හා ඊට ගැළපෙන මාත්‍රා 8 ක තානාලංකාර දෙකක් තාලානුකූලව ලියන්න.

(iii). කාපි රාගයේ සර්ගම් ගීතය ලියා එම රාගයට අදාළ තානාලංකාර දෙකක්ද ලියන්න.

38. (i). බිලාවල් රාගය යනු ශුද්ධ ස්වර පමණක්ම යෙදෙන රාගයකි. එම රාගයේ මධ්‍යලය ගීතයක ස්ථායී කොටස ලියන්න.

(ii). රාගයේ ස්වර සංගති දෙකක් ලියන්න.

39. A, B, C යන ස්වර ප්‍රස්ථාර අයත්වන රාග නම් කර ඒ ඉදිරියෙන් ඊට අදාළ තාල නාමය ලියන්න.

<table>
<tr><th></th><th>ස්වර ප්‍රස්ථාර කොටස්</th><th>රාගයේ නම</th><th>තාලයේ නම</th></tr>
<tr><td>A</td><td>ස රි | ග̲ - ම | ප ප | ප - ප</td><td></td><td></td></tr>
<tr><td>B</td><td>ග - රි | ස - ස රි | ග ප ධ | ප - - - |</td><td></td><td></td></tr>
<tr><td>C</td><td>ග ප ම ග | ම රි ස - | ධ̣ නි̣ ස රි | ග රි ස</td><td></td><td></td></tr>
</table>

40. A කොටසට අයත් රාගයේ ලක්ෂණ ගීතයක්ද?

B කොටසට අයත් රාගයේ ලක්ෂණ ගීතයක්ද?

C කොටසට අයත් රාගයේ සර්ගම් ගීතයක්ද?

ස්ථායී කොටස් පමණක් ලියන්න.

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



agaram.lk